දිනමිණ සිළුමිණ
The Silumina
epaper

# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
# සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා පුරප්පාඩු පිරවීම

## අභ්‍යන්තර විගණන නිලධාරී
## JM 1-1 "කනිෂ්ඨ කළමනාකාර" සේවා ශ්‍රේණිය - තනතුරු 01 කි

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය/ මූල්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම

**හෝ**

2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතිකලත් කළමනාකරණ ආයතනයේ (CMA) හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) අන්තර් මධ්‍ය සහතිකය සම්පූර්ණ කර තිබීම

**හෝ**

3. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (HNDA) සහතිකයක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

**හෝ**

2. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) සේවා ශ්‍රේණියේ (II) වන ශ්‍රේණියේ විෂය ක්ෂේත්‍රයට අදාළ තනතුරක (විගණන හා ගිණුම්) වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප :** JM 1-1 - රු.42,600 - 10x755 - 18x1,135 = 70,580

- රජය විසින් අනුමත සියලුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**වයස :** අවුරුදු 35ට නො අඩු සහ අවුරුදු 55ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

**සෑම අයදුම්කරුවෙකුම,**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**තනතුරට අදාළ පොදු කොන්දේසි**

- මෙම තනතුර ස්ථිර වන අතර, විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 15% ක්ද, සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.
- රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු වේ.
- අයදුම්කරු පිළිබඳ චාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කළයුතුය.
- අධ්‍යාපන, වෘත්තීය සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුවේ.
- අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.

**අයදුම් කළ යුතු ආකාරය**

මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුළත් ජීව දත්ත සටහන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරෙහි **අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම** යනුවෙන් සඳහන් කොට පහත සඳහන් ලිපිනයට 2024.02.09 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ hr@cma.lk දරන email (විද්‍යුත් තැපැල) ලිපිනයට එවිය යුතුය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය,**
**1 වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ - 2.**